


# නිදහස් මාධ්‍ය

නිදහස් නිවහල් දේශයක් උදෙසා


ගවේෂණාත්මක
පැහැදිලිව
සංවේදීබව
පෙළගැස්ම
වෘත්තීය
අයිතීන්
නියාමනය
පෙරළිකාරීත්වය
ප්‍රේක්ෂක විශ්වසනීයත්වය
ආචාරධර්ම
ආකල්ප
මර්දනය
හෘද සාක්ෂිය
සමබරව
වාරණය
වාරණය
ආයතන ප්‍රධානීන්
මූලාශ්‍රවල රහස්‍යභාවය
ප්‍රතිපත්ති
නිර්මාණාත්මකබව
අභියෝග
සමාජ ආකල්ප
ජයගැනීම
මාධ්‍ය
භාෂණයේ නිදහස
තර්ජන
ජාත්‍යන්තර සම්මුතීන්
සත්‍යය සහ අවබෝධය
කුතුහලය
තහනම
අතික්‍රමනය
මහජන මතය
අවධානය
තොරතුරු

# දෘශ්‍ය මාධ්‍ය

© රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ISBN 978-955-9073-20-8

ප්‍රධාන සංස්කාරක
**මහාචාර්ය ආරියරත්න ඇතුගල**

සංස්කරණය
**මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ**

නිර්මාණ සැලසුම
**අනුහස් මහවලගේ**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

2013 මැයි 03 දිනට යෙදෙන
ලෝක නිදහස් මාධ්‍ය දිනය සැමරුමේ
විසි වැනි සංවත්සරය වෙනුවෙන් ද,
කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයට
හතළිස් වසරක් පිරීම හා
දෙසතිය සඟරාවට තිස්පස් වසරක් පිරීම ද සමරමින්
ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන්
‘2010 ජාතික ජනමාධ්‍ය සමුළුවේ දී’ පිහිටුවා ගත්
විශ්වවිද්‍යාල ජනසන්නිවේදනය පිළිබඳ
ආචාර්යවරුන්ගේ සංගමයේ ශාස්ත්‍රීය දායකත්වයෙන්
මෙම කෘතිය එළිදැක් වේ.

–



**මහාචාර්ය**
**චන්ද්‍රසිරි රාජපක්ෂ**
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# ප්‍රකාශන නිදහස ගැන
# සම්භාව්‍ය සාහිත්‍යයෙන්

මානවයා සාමුහික ව ජීවත්වීමට රුචියක් දක්වති. ඔහු හුදකලා බවට එතරම් ඇලුම් නොකර යි. සමාජ අන්තර් සම්බන්ධතාව ගොඩනැඟෙන්නේ සාමුහිකත්වයෙනි. එය සම්බන්ධීකරණය කරණු ලබන්නේ සන්නිවේදනයෙනි. මිනිසා විවිධ ප්‍රකාශන විධික්‍රම භාවිත කරන ලද්දේ එම සමාජ සම්බන්ධතාව ගොඩනඟා ගැනීමට ය. කවිය, ගීතය, චිත්‍රය, ජන කතා, පූජා ක්‍රම යනාදිය මිනිසාගේ ප්‍රකාශන විධික්‍රමයන් ය. මිනිසා තම භාව ප්‍රකාශනය තුළින් ආශ්වාදයක් මෙන් ම සමාජ විවරණයක් ද සිදු කරන ලදී.

සාහිත්‍ය නිර්මාණ තුළ දක්නට ලැබෙන්නේ සන්නිවේදන ප්‍රවණතාවන් ය. පැරණි ලේඛකයෝ සිය අත්දැකීම් සමාජ ප්‍රවර්ධනය සඳහා භාවිත කළහ. ප්‍රකාශනය සහ එහි වගකීම පිළිබඳ ඔවුහු අදහස් ඉදිරිපත් කළහ. ප්‍රකාශන නිදහස ගැන වර්තමාන ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ බහුලව සාකච්ඡා කරනු ඇත. මාධ්‍ය තුළ දී පමණක් නොව විවිධ අවස්ථාවල දී පුද්ගල අදහස් ප්‍රකාශනයේ දී ගැටලු ඇති විය හැකි ය. එය එක් කාලයකට පමණක් සීමා කළ නොහැකි ය. ලංකාවේ සාහිත්‍ය ග්‍රන්ථ අතර දඹදෙණි

යුගයේ ලියවුණු සද්ධර්ම රත්නාවලිය බොහෝ විද්වතුන්ගේ අවධානයට හසු වූ ග්‍රන්ථයකි. ධර්මසේන ස්වාමීන් වහන්සේ විසින් ලියන ලද මෙම ග්‍රන්ථය පොදු ජනයා වෙනුවෙන් රචනා වූවක් ලෙසට බොහෝ විචාරකයන් විසින් පෙන්වා දෙන කරුණකි. සද්ධර්ම රත්නාවලිය සාහිත්‍ය ග්‍රන්ථයක් ලෙස විවිධ විෂය කරුණු ඔස්සේ අධ්‍යයනය කළ හැකි ය. එහෙත් මෙහි දී අපගේ අවධානය යොමු වන්නේ නිදහස් චින්තනය, පුද්ගල නිදහස, ප්‍රකාශන නිදහස යනාදිය ධර්මසේන ස්වාමීන් වහන්සේ විවරණය කළ ආකාරය පිළිබඳව ය. නිදහස ගැන ඉදිරිපත් වන අදහස් විවිධ ආකාරයෙන් විවරණය කළ හැකි ය. මෙම ග්‍රන්ථයේ ඉදිරිපත් වන කතා පුවත්වලින් ද එය පැහැදිලි වේ.

ලේඛකයකු බොහෝ විට පෝෂණය ලබන්නේ සමකාලීන සමාජයේ පවතින සිදුවීම් තුළිනි. ධර්මසේන ස්වාමීන් වහන්සේ එකල පැවති විවිධ සමාජ බලවේගයන්ට යටත් වීමට හෝ ඒවාට ගැති වී තම පුද්ගල නිදහස නැති කර ගැනීමට උත්සාහ නොකල ලේඛකයෙක් ලෙස හැඳින්විය හැකි ය. මේ පිළිබඳ මාර්ටින් වික්‍රමසිංහ මහතා සිය 'සිංහල සාහිත්‍යයේ නැඟීම' ග්‍රන්ථයේ දී දක්වන මේ අදහසින් ද පැහැදිලි වේ. ''ග්‍රන්ථ ඥානයෙන් ම නොව ජීවිතයෙහි දුක සැප දකීමෙන් ඇසීමෙන් හා වහා වටහා ගැනීමෙන් පැසුණු බුද්ධිය ඇති උන්වහන්සේ තුළ කෙලෙස් පීඩනයෙන් පීඩිතයන් නිසා හටගත්තේ කෝපය නොව දයානුකම්පාව ය. කවීත්වයට වැඩි උපාසක කම ඇති අනිත් ඇතැම් ග්‍රන්ථකාරයෙක් කෙලෙස් පීඩනයෙන් පරිපීඩිතයන්ට බැණ වැදුණේ ය. ද්වේෂ කළේ ය. තවත් ග්‍රන්ථකාරයකු දුටුවේ, රජුන්, ඇමතියන්, ධනවතුන් යන ආදීන්ගේ ගුණ මහිමය. සිහි කළේ ඔවුන්ගෙන් ලබන ලාභ සත්කාරය. එවැනි ග්‍රන්ථකාරයකු සුන්දරත්වයක්, විචිත්‍රත්වයක් දුටුවේ ලොකු මිනිසුන්ගේ ජීවිතයෙහි පමණි. ධර්මසේන හිමියෝ මොවුන්ට වඩා බෙහෙවින් වෙනස් ප්‍රතිභාවයක් ඇති ග්‍රන්ථකාරයෙක් වූහ.'' (සිංහල සාහිත්‍යයේ නැඟීම- 118 පිට) වික්‍රමසිංහ මහතා සිය ග්‍රන්ථයේ දී පෙන්වා දෙන පරිදි ධර්මසේන ස්වාමීන් වහන්සේ එකල පැවති සම්මත ක්‍රමයන්ට වඩා වෙනස් ව නිදහස් චින්තනයකින් සිය පන්හිඳ හැසිර වූවෙකි. සද්ධර්ම රත්නාවලිය ග්‍රන්ථය සංස්කරණය කොට මුද්‍රණය කරන ලද පණ්ඩිත කිරිඇල්ලේ ඥාණවිමල ස්වාමීන් වහන්සේ සිය ග්‍රන්ථයේ ප්‍රස්ථාවනාවෙහි මෙසේ සඳහන් කොට තිබේ. 'ධර්මසේන හිමියෝ ත්‍රිපිටක ධර්මය පිළිබඳ හසල බුද්ධිමතෙකි. බහුශ්‍රැත මහ තෙරනමකි. ඒ බැව් ග්‍රන්ථාවසානයෙහි එන කර්තෘ සන්දර්ශන ගාථාවන්හි ද ඇතුළත්ව තිබේ. එසේ ම යමක් ගැන නිදහස් ලෙස සිතාමතා ගැන්මෙන් හා ගැඹුරු

ධර්මයක් තමා අවට තිබෙන කවුරුත් දන්නා සාමාන්‍ය වස්තුවක උපමා වශයෙන් ගෙනහැර පා අවබෝධ කරවීමෙන් ලත් බුද්ධි ප්‍රභාවය අතින් නම් එකල විසූ සියලු පඬිවරයන් ඉක්මවා ගමන් කර තිබෙන බව පෙනේ.' (IX පිට - සද්ධර්ම රත්නාවලිය) මෙසේ බොහෝ දෙනෙකු විවරණය කරන පරිදි සද්ධර්ම රත්නාවලිය සතු විශේෂත්වය වන්නේ නිදහස් අදහස් ප්‍රකාශනයටත් සමාජ සංසිද්ධීන් සතු ලක්‍ෂයන් නිර්භය ව ප්‍රකාශ කිරීමටත් ඇති ශක්තිය නිසා ය. මේ ග්‍රන්ථයේ දැක්වෙන කතා පුවත් කිහිපයක් නිදසුන් ලෙස ගනිමින් ඉහත කී කරුණු අවබෝධ කර ගැනීමට පුළුවන.

නිදහස පිළිබඳ සාකච්ඡා කිරීමේ භාෂණ නිදහස ගැන බොහෝ දෙනා අවධානය යොමු කරනු ඇත. භාෂණයට නිදහසක් ඇත්තා සේ ම එහි සීමාවන් ගැන ද අප දැනගත යුතු ය. ඒ පිළිබඳ ව සද්ධර්ම රත්නාවලියේ 'දාරුචීරිය තෙරුන් වහන්සේගේ වස්තුව' ආරම්භයේ ම කතුවරයා දක්වන්නේ 'තවද නිෂ්ප්‍රයෝජන වචනයෙන් ප්‍රයෝජන නැති නියාවම හඟවන්නට දාරුචීරිය තෙරුන්වහන්සේගේ වස්තුව දක්වමු.' (සද්ධර්ම රත්නාවලිය 590 පිට) යනුවෙනි. වචන භාවිත කිරීමේ දී පුද්ගලයකු ප්‍රයෝජනවත් ලෙස යොදාගත යුතු බවත් අර්ථ ශූන්‍ය දෑ ප්‍රකාශ කිරීම අනර්ථකාරී බවත් මේ කතා පුවතේ දී පැහැදිලි කරයි. 'එහෙයින් නුවණැත්තන් විසින් උගන්නා අවස්ථා වෙහිත් රාම - සීතාහරණාදී විතණ්ඩ ශාස්ත්‍ර නූගෙන තෙවලා බුදු වදනම උගෙන අනුන්ට කියතත්, සප්‍රයෝජන කථාම කියාත් තමාත් යහපත්ව වැස අනුනුත් යහපත් කොට වස්වා මෙලෝ පරලෝ වැඩ සාධනු මැනවි.' (594 පිට) මෙහි දී කතුවරයා සමාජ පරමාර්ථයන්ට අනුව පුද්ගලයෙකු හැසිරිය යුතු ආකාරය පෙන්වා දෙනු ඇත.

අසභ්‍ය වචන භාවිතයෙන් ඇති වන අපහසුතාව 'බාල නක්ඛත්ත වත' (277 - 278 පිටු) මඟින් පෙන්වා දී තිබේ. එම කතා පුවතින් ශික්‍ෂණයකින් යුක්ත පුද්ගලයන්ට ඒවා අසා සිටීමට ඇති අපහසුතාව මෙන්ම අසභ්‍ය වචන ප්‍රකාශ කරන අයගෙන් වෙන් ව සිටීමට දරන උත්සාහය පෙන්වා දී තිබේ. ප්‍රකාශනය සඳහා නිදහස පවතින නමුදු එය තවත් කෙනෙකුට කරදරයක් වන ලෙස පාවිච්චි කිරීමෙන් වැලකිය යුතු ය යන්න මෙවැනි කතා පුවත් තුළින් පැහැදිලි කරන්නකි. වර්තමානයේ වුවද සමහර ජනමාධ්‍ය නාලිකා මඟින් අනෙක් අයට අපහාස වන ලෙස කතා කිරීම නොසරුප් වචන භාවිතය නිසා ඇති වන අප්‍රසන්නතාව හඳුනාගත හැකිය. ජනමාධ්‍යකරුවන්

භාෂාව භාවිත කිරීමේ දී ලබාගත යුතු ශික්ෂණය පිළිබඳ මෙවැනි කතා පුවත් තුළින් වුව ද අවබෝධ කර ගත හැකි ය. නිස්සාර දෑ කතා කිරීමෙන් සිදු වන විපත 'පෘථිවි සන්නිඃ ශ්‍රිත කථා කරන භික්ෂූන් වහන්සේගේ වස්තුව' (344 පිට) තුළින් පෙන්වා දී තිබේ. එම කතාව ආරම්භයේ දී ම 'තවද සප්‍රයෝජන වූ ස්වර්ග මෝක්ෂ බාධක නොවන කථා මුත් බාහිය කතාවෙන් කිසිත් ප්‍රයෝජනයක් නැති නියාව භගවන්නට පෘථිවි සන්නිශ්‍රිත කතා කරන භික්ෂූන් වහන්සේගේ වස්තුව දක්වමු.' (344පිට) යනුවෙන් එකී කථාව දක්වා අවසානයේ දී සඳහන් වන්නේ 'එසේ හෙයින් සත් පුරුෂයන් විසින් නිෂ්ප්‍රයෝජන කථා නම් හස්සාරාමතාවෙහි ඇතුළත් බැවින් හැර අල්පේච්ඡ තාදි වූ සප්‍රයෝජන කථාවෙන් යුක්ත ව සුචරිත පුරා භවක්‍ෂයට උත්සහ කටයුතු' (346 පිට) යනුවෙනි. උග්ගසේන නම් සිටු පුත්හුගේ වත මඟින් ද පෙන්වා දී ඇත්තේ අනුන්ට පරිභව කිරීමෙන් වැළකිය යුතු බව යි. එය භාෂණයේ නිදහසට නිගරු කිරීමකි. 'මේ සිත තබා අනුන්ට හෙළා පිරිහෙළා කීමෙන් දුරුවිය යුතු' (1028) යනුවෙන් කතාව අවසානයේ දැක්වේ. තමා සතු නිදහස කුමක්ද? එය භාවිත කළ හැක්කේ කෙසේ ද යන්න මෙවැනි කථා පුවත් මඟින් ධර්මසේන හිමියෝ පෙන්වා දෙති. 'කෝකාලික වස්තුව' නමැති කතාවෙන් ද පෙන්වා දෙන්නේ 'තවද වාක් පරුෂයෙහි නපුර දක්වන්නට කෝකාලික වස්තුව කියමු' (1046) යනුවෙනි. පුද්ගලයා කට රැක නොගත හොත් සිදු වන විපාක මෙහි දී ගෙනහැර දක්වති. 'බහුභාණිය ජාතකය' ඇසුරින් කරන විවරණය නිසා ජන සමාජයේ 'ඉබ්බට කට රැක ගන්නට බැරි වුණා වාගෙයි,' 'ඉබ්බා අහසින් ගියා වාගෙයි'යන ජන කියමන් ද ගොඩ නැඟී තිබේ. සද්ධර්ම රත්නාවලියෙහි සඳහන් වන්නේ යම් කෙනෙක් 'අනුන්ට හෙළා නොකීමෙන් වාක් සංයමය ඇත්තෝද කියන බණන බසෙක් ඇත්නම් නුවණින් සලකා කිය යුතු බසක්ම කියත්ද, සත්හුන් සිත් ඇත්තෝද යම් කෙනෙකු අර්ථ පමණක් මුත් පාළි කියා ලිය නොහෙත්ද, යම් කෙණෙක් පාළි පමණක් කියාලත් මුත් අර්ථ ප්‍රතිපාදනය කොට කියා ලිය නොහෙත්ද .... උන්ගේ කථා දුවා පීමක් නැති මාළු සේ රසවත් නොවෙයි.' (1047 පිට) ධර්මසේන ස්වාමීන් වහන්සේ පැහැදිලි කරනු ලබන මේ කරුණු වර්තමානයේ දී ද සමාජයේ විවිධ ක්ෂේත්‍රවලින් අසන්නට ලැබේ. නිලධාරීන්, සමාජ සේවකයන්, මැති ඇමතිවරුන් පවා වචන නිසි ලෙස භාවිත නොකිරීමෙන් විවිධ අපහසුතාවලට මෙන්ම සිරගත වීමට පවා ඔවුන්ට සිදු වී ඇති බව පෙනේ. භාෂණයේ නිදහස පමණක් නොව එහි සංයමයත්, වගකීමත් යන කරුණු ගැන අවබෝධයක් ලබා ගත යුතු ය.

පුද්ගලයෙකු භාෂණ නිදහසට අනවශ්‍ය ලෙස සීමා පනවා ගැනීමෙන් එනම්, ස්වයං වාරණයන්හි පිහිටා කටයුතු කිරීමෙන් සිදු වන අයහපත මෙන් ම නිෂ්ප්‍රයෝජන ගැන සද්ධර්ම රත්නාවලියෙහි අනේ පිඬු සිටාණන්ගේ චරිතය ඔස්සේ පැහැදිලි කරයි. බුදු හිමි දවස ධනයෙන් හා බුද්ධ ධර්මය පිළිබඳ මහත් ශ්‍රද්ධාවෙන් අගතැන්පත් ව සිටි අනේපිඬු සිටාණන් බුදු හිමිගේ ප්‍රධාන දායකයකුව සිටත් බුදුන් වහන්සේ විධාවට පත් වේ යැයි සිතා දහම් කරුණු නොවිමසී ය. සිටාණන්ගේ සිතෙහි පවතින විමසීමේ සීමාවන් පිළිබඳව ධර්මසේන හිමියෝ මෙසේ දක්වති. 'පොළොව පස් බොහෝ කොට බඩ පුරා කැවහොත් පසුව සැඟවී වැදහෝනා තැනුන් නැතැයි යන විරුද්ධ කල්පනාවෙන් ගැඩවුලුන් පස් සුඟ කොට කන්නා සේ නැවත අහස වැටී ගියත් ඒ විතරක රැඳුණු මැනවැයි යන විරුද්ධ කල්පනාවෙන් කිරුළුන් පා උඩුකුරු කොට ලා වැද හෝනා සේ , නැවත කොස්වා ළිහිණියන් නොසැලී සිටිනා කලට පොළොව දරාලිය නොහෙතියි යන විරුද්ධ කල්පනාවෙන් පෙඳ සලන්නා සේ මුගේ විරුද්ධ කල්පනාවත් බලවත් නියාය.' (32 පිට) අවශ්‍ය තැනක දී අවශ්‍ය දේ හොඳින් විමසා දැන ගැනීම ඒ තුළින් සැබෑ ස්වරූපය අවබෝධ කර ගැනීමටත් ඇති හැකියාව පිළිබඳ ව මෙහි දී විවරණය වේ. යම්කිසි කාරණයක් හොඳින් අවබෝධ කර ගැනීමට එහි මූලාශ්‍රය තුළින් ඉඩ ලැබෙන බවත්, එසේ ස්වයං වාරණය අනවශ්‍ය තැන්වල දී භාවිත නොකළයුතු බවත් මෙහි දී විවරණය වේ.

භාෂණය පිළිබඳ ව මෙන් ම ජීවත්වීමේ දී නිදහස අර්ථවත් කර ගන්නා ආකාරය හා ඒ තුළින් ඇති වන ගැටලු පිළිබඳවත් සද්ධර්ම රත්නාවලියෙහි විවරණය වේ. නිදසුනක් ලෙස කම් සැප විඳීමේ නිදහස සීමා ඉක්මවා යමින් කටයුතු කිරීමේ ආදීනව කතා වස්තුන් කිහිපයකින් ම ඉදිරිපත් කොට තිබේ. තරුණ අවධියේ දී කාම මිත්‍යාචාරයෙහි නිදහස සොයා යාම පිළිබඳ සමාජ සංසිද්ධීන් අළලා එහි ආදීනව හා ඉන් පුද්ගල නිදහස ඇහිරෙන ආකාරයත් එම අවස්ථාවන්හි යෞවන මදයෙන් නිදහස සොයා යාම පිළිබඳ ජීව විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක ස්වභාවයන් දක්වමින් 'කුණ්ඩල කේසීගේ වස්තුව' (594 පිට), 'පටාචාරා වහන්දෑගේ වස්තුව' (633 පිට), 'චුල්ල පන්ථක තෙරුන් වහන්සේගේ වස්තුව' (263 පිට) යනාදී නිදසුන් කිහිපයක් දැක්විය හැකි ය.

එසේ ම කෙතරම් සම්පත් බහුල වුවත් ඒවා භුක්ති විඳීමේ සමාජ නිදහස පුද්ගලයාට කොතරම් හිමි වුවත් එහි සීමාවන් මෙන් ම පුද්ගලයාගේ

දැරීමේ හැකියාව හා පුද්ගලයා දරන සමාජ තරාතිරම අනුව සීමා පනවා ගනිමින් කටයුතු කළ යුතු බව කතා වස්තූන් ගණනාවකින් සද්ධර්ම රත්නාවලියෙහි සඳහන් වේ.

**නිදසුන 1** - කුම්භඝෝෂක සිටාණන්ගේ වස්තුව (255 පිට) සම්පත් බොහෝ තිබී සැප සම්පත් විඳීමේ නිදහස පැවතුන ද තම සම්පත් පිළිබඳ ව උඩගු නොවී ඒවා පරිභෝජනය කිරීමේ නිදහස පිළිබඳ සීමා දැනගෙන කටයුතු කිරීමේ නුවණැති බව පෙන්වා දෙයි . 'තවද බොහෝ සම්පත් ඇතත් මදයින් උඩගු නොව අනුන්ට යටත්ව විසීම නුවණැති සත්පුරුෂ බොහෝ දෙනාගෙන් ……. කාරණා වන බව හඟවන පිණිස කුම්භඝෝෂක සිටාණන්ගේ වස්තුව දක්වමු.' (255 පිට)

**නිදසුන 2** - පසේනදි කොසොල් රජ්ජුරුවන්ගේ වස්තුව - ආහාර ගැනීමට පවතින නිදහස පමණ දැන ආහාර අනුභව කළ යුතු බව දක්වන්නකි. (999 පිට)

**නිදසුන 3** - සමාජයේ තමන් දරන තරාතිරම අනුව නිදහස සීමා වන අතර තමන් දරන වගකීම හා ඉටු කරන යුතුකම් ආදී මෙහෙවර අනුව නිදහස භුක්ති විඳිය යුතු බව 'එක්තරා පැවිදි කෙනෙකුගේ වත' තුළින් දක්වේ. '…… ගුණයක් නැතිව වෙස් ගත් පමණකින් සිංහ සම් පෙරෙව් පමණකින් කැණහිලුන්ට සිංහ බැවහාර කට නොහැක්කා සේම' (1082 පිට)

**නිදසුන 4** - පුද්ගලයා තමන් ලත් නිදහසින් කවර ආකාරයකවත් නිෂ්ප්‍රයෝජන දෙයක් නොකළ යුතු බව 'රහත් වූ දෙනමකගේ වස්තු දෙක.' (1139) තුළින් පෙන්වා දෙයි.

**නිදසුන 5** - සමාජයේ ජීවත් වීමේ දී පුද්ගලයා සතු ජීවත් වීමේ නිදහස අර්ථවත් ව යොදා ගැනීම වැදගත් බව 'ආනන්ද සිටාණන්ගේ වස්තුව' (456 පිට) තුළින් පෙන්වා දෙයි.

**නිදසුන 6** - තමන් ලද නිදහස සීමාවන් ඉක්මවා කටයුතු කිරීමෙන් පිරිහීමට පත් වන ආකාරය 'මහාකාල තෙරුන් වහන්සේගේ වස්තුවෙහි' (127 පිට) බුදුන් වහන්සේ චූලකාල තෙරුන් පිළිබඳ ව කෙරෙන විග්‍රහයෙන් පැහැදිලි වේ.

මෙබඳු විවිධ ක්ෂේත්‍රවලට අදාළ ව නිදහස පිළිබඳව කරන විග්‍රහයන් සද්ධර්ම රත්නාවලියෙහි දක්නට ලැබේ. වර්තමාන සමාජයට වුව ද එම

විග්‍රහයන්ගෙන් ප්‍රයෝජන ලබා ගත හැකි ය. සද්ධර්ම රත්නාවලිය පැරණි සාහිත්‍ය ග්‍රන්ථයක් වුව ද එහි විවරණය කරන මානව ක්‍රියාකාරකම් හි ලක්ෂණ එදා මෙන් ම අදත් දැක ගත හැකි ය. ධර්මසේන ස්වාමීන් වහන්සේ සාමාන්‍ය ජනයාගේ ජීවිතයෙන් ලද අත්දැකීම් අනුව ග්‍රන්ථයේ ධර්ම කරුණු විවරණය කිරීම නිසාම ඒවා සර්ව කාලීන ව අගය කිරීමට හැකියාව ලැබී ඇත. මානව නිදහස විවිධ පැතිවලින් බලා විවරණය කළ හැකි අතර ඊට අදාළ වූ සෑම කරුණක්ම පාහේ සද්ධර්ම රත්නාවලිය තුළින් මතු කර ගත හැකි වීම ද මේ ග්‍රන්ථයේ විශේෂත්වය වේ. මාධ්‍ය නිදහස පිළිබඳ සමරන මේ අවස්ථාවේ දී පැරණි සාහිත්‍ය නිර්මාණකරුවකු විසින් කරන ලද සමාජ විවරණය අප වඩාත් හොඳින් අවබෝධ කරගත හොත් එය අප ගමන් මග ද සාර්ථක කර ගැනීමට උපකාරී වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


- *සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ - 14 මුද්‍රණය - 2005 - ටයිමේට්ස් ප්‍රින්ටින් හවුස්, පන්නිපිටිය.*
- *සද්ධර්ම රත්නාවලිය - කිරිඇල්ලේ ඤාණවිමල ස්වාමීන් වහන්සේ - සංස්කරණය 2010 - ගුණසේන සමාගම කොළඹ.*